ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2318/16 – 2023 පෙබරවාරි මස 07 වැනි අඟහරුවාදා – 2023.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### වයඹ පළාත් සභාව

1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ III පරිච්ඡේදයේ 33 යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ (i) උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ III පරිච්ඡේදයේ 33 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මා විසින් වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් සුසාන භූමි මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පෞද්ගලික සුසාන භූමියක් ලෙසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,
ගරු ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2022 දෙසැම්බර් මස 01 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලය.
කුරුණෑගල.

1A – PG 6206 – 07 (2023/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය - 01

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය සභා බල සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දෙමටපිටිය ග්‍රාම නිලධාරි වසමේ කීනගස්වෙල පිහිටි " කහටගහකැලේ, කජුගහවත්ත සහ හික්ගහවත්ත" නැමැති ඉඩම වයි. එම්. රංජිත් යාපා බලයලත් මිනින්දෝරු තැන විසින් 2001.08.23 දින මැන සාදන ලද 7714 දරන පිඹුරට අනුව එකී පිඹුරේ සඳහන් ලොට් 01 හි ඉඩමේ උතුරු බස්නාහිර මායිමට යාව දැනට එම පවුලේ සුසාන භූමියක් ලෙස පාවිච්චි කරනු ලබන නොබෙදූ පර්චස් හයක් (අ : 00, රූ : 00 , පර් : 06) විශාල බිම් කොටස සඳහා ජේ.නලාන් ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2021.02.26 වෙනි දින මැන සෑදූ අංක: 224 දරන පිඹුරට අනුව ලොට් 01 සහ 02 දරන එක්ව බැඳී ඉඩමට මායිම්

| | | |
|---|---|---|
| *උතුරු නැගෙනහිරට* | - | ඉහත කී අංක 7714 දරන පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස ද , |
| *දකුණු නැගෙනහිරට* | - | ඉහත කී අංක 7714 දරන පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස ද, |
| *දකුණු බස්නාහිරට* | - | පොදු මාර්ග කොටස ද, |
| *උතුරු බස්නාහිරට* | - | සාන්ත ඇග්නස් රෝමානු කතෝලික දේවස්ථාන පරිශ්‍රය ද, |

මායිම් වූ පර්චස් හයක් (අ : 00, රූ: 00, පර්: 06) විශාල බිම් කොටස වේ.

EOG 02-0050

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.